**පළාත් මාර්ග ව්‍යාපෘතිය (උතුරු පළාත) - 2015**

-----------------------------------------------------------

පළාත් මාර්ග ව්‍යාපෘතියේ (උතුරු පළාත) 2015 ජනවාරි 01 සිට 2015 ඔක්තෝබර් 15 දක්වා කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය(ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) අතර 2010 ජනවාරි 11 දින එළඹි අංක 4630- එල්කේ දරන ණය ගිවිසුමේ 4.09(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

------------------------------------------------------------------------------------

පළාත් මාර්ග ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර උතුරු පළාත් සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ වැඩිදියුණු කළ මාර්ග යටිතල පහසුකම් පිළිබඳ තිරසාර කළමනාකරණය මගින් උතුරු පළාතේ සමාජ, ආර්ථික මධ්‍යස්ථාන සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 2,399.25 කට සමාන එජඩො මිලියන 21 ක් වන අතර, සම්පූර්ණ මුදල ජාත්‍යන්තර සංවර්ධන සංගමය සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මාර්තු 31 දින ආරම්භ කරන ලද අතර, 2015 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, 2015 ඔක්තෝබර් 15 දින දක්වා ව්‍යාපෘතියේ කටයුතු පවත්වා ගෙන ගොස් තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ

තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 ඔක්තෝබර් 15 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 2.1 මතය

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 ඔක්තෝබර් 15 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2015 ඔක්තෝබර් 15 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2015 ඔක්තෝබර් 15 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

විශේෂ ඩොලර් ගිණුමේ පැවතුණු රු. මිලියන 44.15කට සමාන එජඩො 312,599 ක ශේෂය 2015 සැප්තැම්බර් 15 දින ණය සපයනු ලබන නියෝජිතායතනය වෙත ආපසු යවා තිබුණි. කෙසේ වුවද විශේෂ ඩොලර් ගිණුමේ රු. මිලියන 41.98 ක් වූ ශේෂය 2015 ඔක්තෝබර් 15 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-------------------------

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ හා 2015 ඔක්තෝබර් 15 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ, වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යායනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | | 2015 ඔක්තෝම්බර් 15 දින දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං | 21.00 | 2,399.25 | 773 | 4.63 | 617.83 | 20.68 | 2,509.95 |
| ශ්‍රීලංර | - | - | 9 | - | 8.60 | - | 20.17 |
| එකතුව | 21.00 | 2,399.25 | 782 | 4.62 | 626.43 | 20.68 | 2,530.12 |

### 3.2 භෞතික ප්‍රගතිය

ලබාගත හැකිවූ තොරතුරු අනුව, උතුරු පළාතේ ආසන්න වශයෙන් කිලෝමීටර 100 පළාත් මාර්ග පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂා කර තිබුණ ද දිග කිලෝමීටර 60.64ක් වූ පළාත් මාර්ග 12ක් පුනරුත්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත් පැකේජ 04 ක් පිරිනමා තිබුණි. පැකේජ 02 යටතේ කිලෝමීටර 23.07 ක් වූ මාර්ග 06ක පුනරුත්ථාපන කාර්යයන් දින 150 සිට දින 174 දක්වා වූ කාල පරාසයක ප්‍රමාදයකින් යුතුව 2013 ඔක්තෝබර් 30 දින වන විට නිමකර තිබුණි. වෙනත් පැකේජ 02 ක් යටතේ පළාත් මාර්ග පුනරුත්ථාපනය සිදු කිරීම සඳහා පිරිනමා තිබූ කොන්ත්‍රාත් 2012 වර්ෂයේ දී අවලංගු කර 2013 වර්ෂයේ දී වෙනත් කොන්ත්‍රාත්කරුවන් වෙත නැවත පිරිනමා 2015 මාර්තු 31 දින වන විට නිම කර තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පැකේජ 01 යටතේ මාර්ග පුනරුත්ථාපන කටයුතුවල යෙදුණු කොන්ත්‍රාත්කරුවෙකු විසින් දින 123ක කාලය දීර්ඝ කිරීමක් සඳහා රු.මිලියන 6.7ක බේරුම්කරණ වන්දියක් ඉල්ලා ඇති බව නිරීක්ෂණය විය. ලැබුණු තොරතුරු අනුව, වන්දිය නිරවුල් කිරීම සඳහා සමාලෝචිත කාලසීමාව තුළ ව්‍යාපෘතිය මඟින් රු. මිලියන 15.18 ක මුදලක් ගෙවා තිබුණි. තවද, වෙනත් මාර්ග පැකේජ 02ක් යටතේ මාර්ග පුනරුත්ථාපන කටයුතු වල යෙදුණු කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලා ඇති බේරුම්කරණ වන්දි වෙනුවෙන් සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතිය විසින් නීති ගාස්තු ලෙස රු.මිලියන 2.62 ක් ද වැය කර තිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් පැකේජ 02 යටතේ පුනරුත්ථාපනය කරන ලද මාර්ග, උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වලංගු හේතු රහිතව දින 132ක ප්‍රමාදයකින් යුතුව පවරාගෙන තිබූ බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත් කොන්දේසිවල ඩී - 43 වගන්තිය අනුව, පුනරුත්ථාපනය කරන ලද මාර්ග දින 07ක් ඇතුළත පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) මාර්ග වැඩ වල විෂය පථයේ විචලනයන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ හෝ උපදේශකගේ උපදෙස් රහිතව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අනුමත කර තිබූ බව නිරීක්ෂණය විය. එම නිසා 3ආර් පැකේජය යටතේ උඩුවිල් - සන්දිලිපායි මාර්ගයේ බෝක්කුවල පුනරුත්ථාපන කටයුතුවල විෂය පථය මුලින් ඇස්තමේන්තු කරන ලද වැඩ වලින් රු. මිලියන 12.34 ක වටිනාකමක් නියෝජනය වන සියයට 73 ක ප්‍රතිශතයකින් අඩු කර තිබුණි. තවද 5ආර් පැකේජය යටතේ මඩතිවු මාර්ගයේ ආධාරක බැම්වල ඉදිකිරීම් කටයුතුවල විෂය පථය මුලින් ඇස්තමේන්තු කරන ලද වැඩ වලින් රු.මිලියන 10.38 ක වටිනාකමක් නියෝජනය කරන සියයට 44ක ප්‍රතිශතයකින් ව්‍යාපෘති අධ්‍යක්ෂගේ අනුමැතිය සහිතව අඩුකර තිබුණි.

(ඈ) 2013 ඔක්තෝබර් මස මාර්ග පුනරුත්ථාපන කටයුතු අවසන් කරන ලද කොන්ඩාවිල් - ඉරුබලායි මාර්ගයේ සහ තිරුනේලි - පුත්තූර් මාර්ගයේ මාර්ග තලයේ ස්ථාන කිහිපයකම ඉරිතැලීම් සිදුවී ඇති බව 2016 මැයි 15 දින විගණන නිළධාරීන් විසින් සිදු කරන ලද වැඩබිම් පරීක්ෂාවේදී අනාවරණය විය. මෙයින්, මාර්ග පුනරුත්ථාපන කටයුතුවල ගුණත්වය අසමත්වීම් පිළිබඳ සාක්ෂි සපයනු ලැබේ.

### 3.4 ව්‍යාපෘති කාර්යයන් අවසන් කිරීම

2015 මාර්තු 31 දිනට ව්‍යාපෘතියේ කාර්යයන් නිම කර තිබුණද, තොග විෂයයන් භාර දීමට සහ 2015 ඔක්තෝබර් 15 දිනට ඇවර කිරීමේ ගිණුම් සහ ව්‍යාපෘති අවසන් වාර්තාව පිළියෙළ කිරීමට ව්‍යාපෘතිය සහ ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.